# WEB DESIGNING USING MULTIMEDIA

# (Part-III)

# වෙබ් නිර්මාණ මෘදුකාංග

මේවා මගින් WYSIWYG (What You See Is What You Get) ලෙස හඳුන්වනු ලබන සංකල්පයට අනුව රූපමය අතුරු මුහුණත තුළ සැලසුම් කරන ආකාරයට ම වෙබ් පිටු නිර්මාණය කළ හැකි ය.

## වෙබ් නිර්මාණ මෘදුකාංග වර්ග

- වෙබ් සංස්කාරක (Web authoring tool)
- සන්ධාර කළමණාකරණ පද්ධති (Content Management Systems / CMS)

# වෙබ් සංස්කාරක (Web authoring tools)

මෙම වෙබ් නිර්මාණ මෘදුකාංගවල විශේෂත්වය වන්නේ නිර්මාණකරු විසින් චිත්‍රක අතුරු මුහුණත භාවිතයෙන් වෙබ් පිටුව නිමවනු ලබන අතරතුර ස්වයංක්‍රීය ලෙස අදාළ HTML ලේඛනය ද වෙන ම අතුරු මුහුණතක සකස්වීමයි.

ClassWork.LK

මෘදුකාංග:-

- Kompozer (Open source)
- Ckeditor (Open source)
- Bluegriffon (Open source)
- Adobe dream weaver (Paid)
- Microsoft front page (Paid)
- Visual studio (Paid)

## ස්ථිතික වෙබ් අඩවි හා ගතික වෙබ් අඩවි

### ස්ථිතික වෙබ් අඩවි

වෙබ් අඩවියක සන්ධාරය නොවෙනස් ව හෙවත් ස්ථාවර ලෙස යම් කිසි කාලයක් පවත්වාගෙන යන්නේ නම් එය ස්ථිතික වෙබ් අඩවියක් ලෙස හැඳින්වේ.

මේවායේ ව්‍යුහය හා සන්ධාරය HTML කේතය තුළින් නිර්මාණය වේ.

ClassWorkLK

## ගතික වෙබ් අඩවි

වෙබ් අඩවියක සන්ධාරය නිරන්තර ව වෙනස් වන්නේ නම් එය ගතික වෙබ් අඩවියක් ලෙස හැඳින්වේ.

මේවා PHP (Hypertext Preprocessor), ASP.net (Active Server Page.net), JSP (Java Server Page) වැනි පරිගණක භාෂාවලින් සකස් කර ඇත.

## සන්ධාර කළමණාකරණ පද්ධති (CMS)

ගතික ලෙස වෙබ් අඩවි නිර්මාණයට, සන්ධාර කළමනාකරණයට හා ප්‍රකාශයට පත්කිරීමට භාවිත කෙරෙන මෘදුකාංගයක්, සන්ධාර කළමනාකරණය පද්ධතියක් ලෙෂ හැඳින් වේ.

CMS මෘදුකාංග:-

- Jumla
- Wordpress
- Drupal

ClassWork.LK

## වෙබ් අඩවි නිර්මාණය ආශ්‍රිත භූමිකා

- වෙබ් අඩවි නිර්මාපක (Author)
- සංස්කාරක (Editor)
- ප්‍රකාශක (Publisher
- වෙබ් අඩවි පරිපාලක (Administrator
- පරිශීලකයන් (Users)

## වෙබ් අඩවි ප්‍රකාශයට පත්කිරීම (Publication of a website)

### මේ සඳහා වෙබ් අඩවි ප්‍රකාශකයකු සපුරා ගත යුතු අවශ්‍යතා

- වෙබ් අඩවි නිර්මාණ මෘදුකාංගයක්
- වෙබ් සත්කාරකයක්
- වසම් නාමයක්
- උඩුගත කිරීමේ මෘදුකාංගයක්
- අන්තර්ජාල සම්බන්ධතාවක්

ClassWork.LK

## වෙබ් සත්කාරක (Web host)

නිර්මාණය කරන වෙබ් අඩවිය, අන්තර්ජාලය ඔස්සේ ඕනෑ ම අයකුට ඕනෑ ම මොහොතක ඕනෑ ම තැනක සිට ප්‍රවේශ විය හැකි ලෙස කිසි යම් ස්ථානයක තැන්පත් කිරීම සඳහා සේවා සපයන පරිගණක වෙබ් සත්කාරක ලෙස හැඳින්වේ.

## වසම් නාමය (Domain name)

වෙබ් අඩවියක් අනන්‍ය ව හඳුනාගැනීම සඳහා ICANN (Internet Corporation for Assigned Names and Numbers) ලෙස හඳුන්වන අන්තර්ජාතික ආයතනය මගින් ලියාපදිංචි කරමින් ලබා දෙන ලිපිනය වසම් නාමය ලෙස හැඳින් වේ.

## උඩුගත කිරීමේ මෘදුකාංග (File Transfer Protocol/FTP)

වෙබ් අඩවිය අදාළ අන්තර්ජාල සම්මුතීන්ට අනුව, තෝරාගත් වෙබ් සත්කාරකයා වෙත උඩුගත කිරීමට භාවිත කරන මෘදුකාංග මේ නමින් හැඳින්වේ.

ClassWork LK

## අන්තර්ජාල සම්බන්ධතාව

**ශ්‍රී ලංකාවේ වූ අන්තර්ජාල සේවා සපයන ආයතන**

- SLTMOBITEL
- Dialog axiata

## වෙබ් අඩවි නඩත්තුව


- වෙබ් අඩවියේ ස්වභාවය මත දෛනික ව, සතිපතා හෝ මාසික ව එහි අන්තර්ගතය යාවත්කාලීන කළ යුතු ය.

- වෛරස් වැනි අහිතකර කේත, අනවසර ඇතුළුවීම් ආදිය නිසා ඇති වන හානි වීම් වලින් වැළකීමට කටයුතු කිරීම.

- වෙබ් අඩවිය නිර්මාණයට යොදාගත් මෘදුකාංගවල නව අනුවාද නිකුත් වී තිබේ නම් ඒ අනුව වෙබ් අඩවිය යාවත්කාලීන කළ යුතු ය.

ClassWork.LK

# වෙබ් අඩවි නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය




Class Work LK

ClassWork.LK